# මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ

## මෝටර් රථ රියදුරු සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2021

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරු තනතුරේ පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරු සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගයට පහත සඳහන් සුදුසුකම් ඇති මධ්‍යම පළාත් සභාවේ සේවයේ නිරත රා.ප.ච 03/2016 අනුව PL1, PL2, හා PL3 කාණ්ඩය යටතේ වැටුප් ලබන තනතුරු සඳහා ස්ථිර/අනියම්/ආදේශක පදනමින් බඳවා ගෙන ඇති පිරිමි අයැදුම්කරුවන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය මහනුවර නගරයේදී පමණක් හෝ අයැදුම්කරුවන් සංඛ්‍යාව හා ඔවුන්ගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය අනුව මහනුවර, මාතලේ හා නුවරඑළිය යන නගරයන්හීදි හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරනු ලබන පරිදි පැවැත්වේ.

1. පොදු සුදුසුකම්
   - 1.1 අයැදුම්කරු ශ්‍රී ලාංකික විය යුතුය.තවද මධ්‍යම පළාත් සභාවේ සේවයේ නිරත වන්නෙකු විය යුතුය.
   - 1.2 අයැදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
   - 1.3 සෑම අයැදුම්කරුවෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
   - 1.4 අයදුම්කරුවන්ගේ උස අවම වශයෙන් අඩි 05 අඟල් 02 1/2 ක් විය යුතුය.
   - 1.5 දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් නොලැබූ අයකු විය යුතුය.
   - 1.6 රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ අසාධු ලේඛණයට නම ඇතුලත් නොවූ අයකු විය යුතුය.
   - 1.7 දිවා කාලය හා රාත්‍රි කාලයේදී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්වයක සිටිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.
   - 1.8 මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.

2. අධ්‍යාපන සුදුසුකම් ශිල්පීය නිපුණතා/ ප්‍රවිණතා හා පළපුරුද්ද

   මෙහි දැක්වෙන සියලු සුදුසුකම් 2021.05.21 දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

   2.1 අධ්‍යාපන සුදුසුකම්

   රා.ප.ච. 03/2016 අනුව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ PL1, PL2, හා PL3 තනතුරු සඳහා ස්ථිර/අනියම්/ආදේශක පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට එම බඳවා ගැනීම සිදුකරන අවස්ථාවේ පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ (අ.පො.ස. සා/පෙළ හෝ 08ශ්‍රේණිය/09 වසර සමත් වී තිබිය යුතුය. අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා විභාග දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන සහතික හෝ ශිෂ්‍ය කාර්ය දර්ශකයය පමණක් සලකා බලනු ලැබේ. **එම සහතික වල පිටපත් අයදුම්පත්‍රය සමඟ අමුණා එවිය යුතුය.**

   2.2 ශිල්පීය නිපුණතා/ ප්‍රවිණතා

   අයැදුම්පත් භාර ගන්නා අවසාන දිනට වසර 03 කට පෙර තාරබර හොන්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ මෝටර් ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද වෘත්තීය ප්‍රවිණතා බලපත්‍රයක් ලබා සිටිය යුතුය ( **සී** සහ **සී** 1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව **බී** පන්තියේ බලපත්‍රයක් ලබා තිබිය යුතුය)

3. වැටුප :- රා.ප.ච. අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, මධ්‍යම පළාත් රාජ්‍ය මෝටර් රථ රියදුරු සේවයේ lll, ll, 1 වන හා විශේෂ ශ්‍රේණිවලට අදාළ මාසික වැටුප් පරිමාණය PL 3-2016 ට අදාළ : රු. 25,790 – 10x270 -10 x 300 – 10 x 330 – 12 x 350– රු. 38,990 කි. පත්වීම ක්‍රියාත්මක වන දින සිට රු. 25790/- ක වැටුප ගෙවනු ලැබේ. රු.28,490/- න් ඔබ්බට යාම සඳහා ll වන ශ්‍රේණියට උසස් වීමද රු. 31,490 /- න් ඔබ්බට යාම සඳහා l වන ශ්‍රේණියට උසස් වීම ද රු. 34,790/- ඔබ්බට යාම සඳහා විශේෂ ශ්‍රේණියට උසස් වීමද ලබා ගත යුතුය. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාද ඔබට හිමිවේ.

4. බඳවා ගැනීමේ කොන්දේසි.

   මෙම තනතුරට අදාළව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බඳවා ගැනීමේ පරිපාටිය අනුව බඳවා ගැනීමේ කොන්දේසි තීරණය වේ.

5. බඳවා ගැනීමේ ක්‍රමය.

සියලු බඳවා ගැනීම් සඳහා මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයකදී ලබා ගන්නා ලකුණු ප්‍රමුඛතාවය මත පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව මෙන් දෙගුණයක් ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සඳහා 40% ක අවම ලකුණු ප්‍රමාණයක් ද ප්‍රායෝගික පරීක්ෂණයට 40% ක අවම ලකුණු ප්‍රමාණයක් ද තිබිය යුතුය. ප්‍රායෝගික පරීක්ෂණයට ලකුණු ලබා දීමේදී නිර්නායක 03ක් යටතේ ලකුණු ලබා දෙන අතර එයින් සමත් වීම සඳහා එක් එක් නිර්නායකයන්ට 40%ක අවම ලකුණු ප්‍රමාණයක් ලබා තිබිය යුතු අතර ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ වල ලකුණු එකතුවෙහි ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ

| නිර්නායකය | ලබා දෙන මුලු ලකුණු ප්‍රමාණය | සමත්වීම සඳහා ලබාගත යුතු ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| I.රිය පැදවීමේ නිපුනත්වය | 40 | 16 |
| II.මහාමාර්ග නීති පිළිබඳ ප්‍රා යෝගික දැනුම | 40 | 16 |
| III මෝටර් යාන්ත්‍රක විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 08 |

6. සේවා කොන්දේසි.

6.1. මෙම තනතුරට පත් කරනු ලබන මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන හා අදාල තනතුරේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන්ට පත්වීමේ දින සිට එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත්ව හා අනෙකුත් අයදුම්කරුවන්ට වසර 03ක පරිවාස කාලයකට යටත්ව පත්වීම් දෙනු ලැබේ. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් පිළිබඳව රජය විසින් කලින් කලට පනවනු ලබන නියමයන්ට යටත් වේ.

6.2. අදාළ පත්වීම රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට අදාළ අනෙකුත් චක්‍රලේඛවල සඳහන් විධිවිධානයන්ට යටත් වේ.

6.3. මෙම තනතුරට පත් කිරීමෙන් අනතුරුව මධ්‍යම පළාත තුළ ඕනෑම සේවා ස්ථානයක වසර 03 ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන් සේවය කළ යුතු අතර, එම කාලය තුළදී මධ්‍යම පළාතෙන් පිටතට ස්ථාන මාරු ලබා ගැනීමට කරනු ලබන කිසිඳු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ.

7. අයැදුම් කිරීමේ ක්‍රමය.

7.1 විභාග ගාස්තුව රු.600 /කි. මෙම විභාග ගාස්තුව මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන පරිදි මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට අයදුම්කරුගේ නමින් ගෙවා ඒ සඳහා ලබා ගත් නිල් පැහැති ලදුපත අයැදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එකී ලදුපත නොමැතිව එවන අයැදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර ගෙවන ලද විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

7.2. අයැදුම්පත්‍රය මෙම නිවේදනය සමඟ අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කර මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ දැනට දරන තනතුරට අදාළ පත්වීම් ලිපියේ ආයතන ප්‍රධානියා විසින් සහතික කරන ලද පිටපත හා නියමිත අධ්‍යාපන සුදුසුකම් සනාථ කරන සහතික වල පිටපත් සමඟ 2021.05.21 දිනට පෙර ලැබෙන සේ ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාරෙ, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයැදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයැදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ “ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරු සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2021” සහ පදිංචි දිස්ත්‍රික්කය සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයැදුම්පත් හා අසම්පූර්ණ අයැදුම්පත් කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැලේදී අස්ථානගතවන අයැදුම්පත් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වගකියනු නොලැබේ.

8. විභාග මාධ්‍යය

විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයැදුම්පත්‍රයේ තමන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයට නියමිත අක්ෂරය පැහැදිලිව සඳහන් කළ යුතු අතර, එය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

09. විභාග මධ්‍යස්ථානය
විභාග මධ්‍යස්ථානය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයැදුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍රය මඟින් දැනුම් දෙනු ලැබේ.

10. ලිඛිත විභාගය හා විෂය නිර්දේශය.
අයැදුම්කරුවන් මෙම තනතුරට බඳවා ගැනීම සඳහා පහත සඳහන් විෂය නිර්දේශයන් යටතේ ලිඛිත විභාගයකට යොමු කරනු ලැබේ.

මාර්ග නීති පිළිබඳ දැනුම හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දැනුම - (කාලය පැය 02 යි)
උපරිම ලකුණු ප්‍රමාණය 100
සමත්වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය 40

11. අයැදුම්පත් පිරවීම සඳහා උපදෙස්.
ආදර්ශ අයැදුම්පත් ආකෘතිය ප්‍රකාර A 4 ප්‍රමාණයක කඩදාසිය දෙපැත්තම භාවිතා කරමින් එහි පළමු පිටුවෙහි අංක 1-4 දක්වා කරුණු ද අනෙක් පිටුවල ඉතිරි ඡේදද ඇතුළත්වන සේ සකස් කර ගත යුතුය. අයැදුම්පත්‍රය යතුරු ලියනය කර ගැනීමෙන් හෝ පැහැදිලි අත් අකුරින් සකස් කර ගත යුතුය. අයැදුම්පත්‍රය පිරවීමේදී පහත දැක්වෙන සංකේත අංක නියමිත කොටුවල පැහැදිලිව සඳහන් කළ යුතුය.

11.1.අයැදුම් කරන දිස්ත්‍රික්කය ලෙස සඳහන් කල යුත්තේ අයැදුම්කරුගේ ස්ථිර පදිංචිය ඇති දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකයයි.

| | | |
|---|---|---|
| මහනුවර | - | 01 |
| මාතලේ | - | 02 |
| නුවරඑළිය | - | 03 |

11.2. අයදුම්කරු සම්බන්ධව ආදර්ශ අයදුම්පත්‍රයේ අනු අංක 09 යටතේ දැක්වෙන ආකාරයේ නිර්දේශයක් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉදිරිපත් කළ යුතුය.

12. යම් අයදුම්කරුවෙකුට විභාගය සඳහා පෙනී සිටීමට අවස්ථාව ලබා දීම මධ්‍යම පළාත් මෝටර් රථ රියදුරු සේවයේ තනතුරක් ලැබීමට අනිවාර්ය සුදුසුකමක් නොවේ. අයැදුම්කරුවෙකුට බඳවා ගැනීමේ දැන්වීම ප්‍රකාරව සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර හෝ පත්වීම් ලබා දීමෙන් පසු හෝ ඕනෑම අවස්ථාවකදී අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කෙරෙනු ඇත. එසේම දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑකමින් යටපත්කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

13. අයැදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරු පත්වීමක් ලබාදීම සඳහා තෝරාගනු ලැබී නම් ඔහු මුදාහැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා කැමති විය යුතුය.

13.1 මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ප්‍රවේශ පත්‍ර ඇති නිලධාරින්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි, දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය.ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

14. අයදුම්කරුගේ අනන්‍යතාවය - අයදුම්කරුවන් විභාග ශාලාව තුලදී විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි, ස්වකීය අනන්‍යතාවය පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත මඟින් හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය මඟින් පමණක් සනාථ කළ යුතුය.

15. මෙම නිවේදනයේ විධිවිධාන සලසා නැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම /තීරණය කිරීම, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

16. මෙහි සිංහල, දෙමළ මාධ්‍ය නිවේදන අතර, කිසියම් අනනුකූලතාවයක් පවතී නම් , එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කල යුතුය.

2021 මැයි මස 03 වෙනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

ටී.ඒ.ඩී.ඩබ්. දයානන්ද
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත් සභාව.

ආදර්ශ අයැදුම්පත්‍රය

<u>මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරු සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය- 2021</u>

විභාග අංකය [ ]
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- [ ] ( සිංහල - S, දෙමළ - T, ඉංග්‍රීසි - E )
(අදාළ සංකේතය කොටුව තුළ ලියන්න)

පදිංචි දිස්ත්‍රික්කය:- [ ] දිස්ත්‍රික්කයට අදාළ සංකේත අංකය [ ]

මහනුවර - 01
මාතලේ - 02
නුවරඑළිය - 03

01. 1.1 මුලකුරු සමඟ නම:- .......................................................................................................
Mr(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.2 මුලකුරු සමඟ නම: - .......................................................................................................
මයා(සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):-................................................
.....................................................................................................................................

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්:-)......................................................................

02. 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්):-......................................................................
.......................................................................................

2.2 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්):-.........................................................
.....................................................................................................................................

2.3 ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):-
.....................................................................................................................................
.....................................................................................................................

2.4 දුරකථන අංකය:-..................................

03. 3.1සේවා ස්ථානයේ නම( ඉංගීසී කැපිටල් අකුරෙන්):- .......................................................................

3.2. සේවා ස්ථානයේ නම හා ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්):- .....................................................................

04. 4.1උපන් දිනය:-....................................

4.22021.05.21දිනට වයස:- අවු........මාස......... දින........

4.3ජාතික හැඳුනුම්පත් අංකය:- [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

05.සේවා විස්තර

5.1. ඔබ දැනට සේවය කරන ආයතනයේ නම :- ..........................................................................................

5.2.එය අයත්වන අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව :- ..........................................................................................

5.3.දැනට දරන තනතුරේ පදවි නාමය :-..........................................................................................................

5.4.දැනට දරන තනතුරේ ස්භාවය - (ස්ථිර/අනියම්/ආදේශක) - :........................................

5.5.දැනට දරන තනතුරට පත් වූ දිනය :- .............................................

5.6. පත්වීම් ලිපියේ අංකය හා දිනය :- ............................................**(පත්වීම් ලිපියේ සහතික කල පිටපතක් මේ සමඟ අමුණා එවන්න)**

5.7.දැනට දරන තනතුරේ ස්ථිර කර තිබේ ද - ඔව්/නැත (අනවශ්‍ය වචනය කපා හරින්න)

5.8.දැනට දරන තනතුරට අදාල වැටුප් පරිමාණය- - (රා.ප.ච 03/2016 අනුව)PL1/ PL2/ /PL3 (අනවශ්‍ය වචනය කපා හරින්න)

5.9. දැනට දරන තනතුර විශ්‍රාම වැටුප් සහිතද යනවග - සහිත/රහිත:- ..........................

5.10.2021.05.21දිනට දැනට දරන තනතුරේ සේවා කාලය:-.....................

06. ලබා ගෙන ඇති අධ්‍යාපන සුදුසුකම:-..........................................

අ.පො.ස (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර ( ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද විභාග සහතිකය ප්‍රකාරව) **(පිටපත් අමුණා එවිය යුතුය.)**

**පළමුවර දෙවනවර**

6.1 විභාග වර්ෂය:- ......................... විභාග වර්ෂය: - ....................... 6.2 විභාග අංකය

:- .......................... විභාග අංකය : - .......................

| අනු අංකය | විෂය | සාමාර්ථය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

| අනු අංකය | විෂය | සාමාර්ථය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

07.රියදුරු බලපත්‍රය පිළිබඳ විස්තර

7.1. රියදුරු බලපත්‍රයේ වර්ගය :- .................................................

7.2. රියදුරු බලපත්‍රය නිකුත්කළ දිනය :- ...................................................

7.3. රියදුරු බලපත්‍රයට අනුව තාරබරහොන්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන්රථ පැදවීම පිළිබඳ නිපුනතාවය ලද දිනය:- .................................................

**(රියදුරු බලපත්‍රයේ සහතික කල පිටපතක් අමුණා එවන්න)**

7.4.විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු

i.විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම :-.......................................................

ii.දිනය :-.......................................................

iii.කුවිතාන්සි අංකය :-.......................................................

( මුදල් ගෙවා ලබාගත් ලදුපත මෙම තීරුව මත අලවන්න )

**අයදුම්කරුගේ ප්‍රකාශය**

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මා දනිමි.

.................................. .............................................

දිනය අයදුම්කරුගේ අත්සන

08.අත්සන සහතික කිරීම

මාගේ ආයතනයේ සේවයේ නිරත (ස්ථිර/අනියම්/ආදේශක) නිලධාරියකුවන .....................................................
............................................................................ මහතා ......................... වැනි දින මා ඉදිරිපිට අත්සන් කළ බව සහතික කරමි.

දිනය:-...............................

......................................
ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)

09. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

9.1මෙමඅයදුම්පත ඉදිරිපත්කරන: -.........................................................................................මහතා මෙම දෙපාර්තමේන්තුවට අයත්.................................................................................. ආයතනයේ සේවයේ නියුක්ත අයෙකු බවද

9.2.සේවා කාලය තුළ මෙම සේවක මහතාගේ (අනවශ්‍ය වචනය කපාහරින්න)

a) රාජකාරි කටයුතු - (ඉතා හොදයි/හොදයි/සතුටුදායකයි/අසතුටු දායකයි)
b) පැමිණීම - (ඉතා හොදයි/හොදයි/සතුටුදායකයි/අසතුටු දායකයි)
c) හැසිරීම - (ඉතා හොදයි/හොදයි/සතුටුදායකයි/අසතුටු දායකයි)

9.3.මෙම සේවක මහතාගේ සේවා කාලය තුළ කිසියම් විෂමාචාරයකට සම්බන්ධ වී( ඇත/නැත)(අනවශ්‍ය වචනය කපාහරින්න)

9.4.අදාළ අයදුම්කරු හට සේවා කාලය තුළ කිසියම් විෂමාචාරයකට සම්බන්ධ වි ඇත්නම්(එම සේවක මහතා සම්බන්ධව විනය ක්‍රියා මාර්ග ගෙන ඇත්නම්/ඉදිරියට විනය ක්‍රියා මාර්ග ගැනිමට අදහස් කරන්නේ නම්ඒ පිළිබඳ තොරතුරු

.........................................................................................................................................................
.........................................................................................................................................................
.........................................................................................................................................................

9.5.මෙම අයදුම්පත ඉදිරිපත් කරන ......................................................................................... මහතා 2021.05.21 දිනට රා.ප.ච 03/2016 අනුව PL1/ PL2/ PL3 වැටුප් පරිමාණයට අයත් තනතුරකස්ථිර/අනියම්/ආදේශක පදනමින් සේවයේ නිරත වන බව ද(අනවශ්‍ය වචනය කපා හරින්න), මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරු IIIවන ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගයේ විභාග දැන්වීම ප්‍රකාරව 2021.05.21 දිනට සියලු සුදුසුකම් සපුරා ඇති බවත්, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු දැනට දරන තනතුරෙන් නිදහස් කරනු ලබන බවද,සහතික කරමි.

දිනය:-...............................

......................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේඅත්සන
(නිල මුද්‍රාව)

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේනම:-..........................................
තනතුර :-.........................................
ලිපිනය :-.......................................................................................

දුරකථන අංකය :-..........................................